# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,919 - 2015 ජුනි මස 12 වැනි සිකුරාදා - 2015.06.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 890 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 906 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජූලි මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජුනි මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## ගල්ගමුව ප්‍රාදේශීය සභාව

ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම

වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර, අනියම්, තාවකාලික, ආදේශක, ස්වේච්ඡා සේවකයින් ගැන වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | ආදාහනාගාර ක්‍රියාකරු | 01 | (රා.ප.ච. 6/2006 IV) PL 1-2006A රු.11,730-10x120-10x130-10x145-12x160- රු.17,600 | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත්වී තිබිය යුතුයි. (වෛකල්පිත විෂයයන් හැර). |
| 02 | ආදාහනාගාර සහායක | 01 | (රා.ප.ච. 6/2006 IV) PL 1-2006A රු.11,730-10x120-10x130-10x145-12x160- රු.17,600 | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත්වී තිබිය යුතුයි. (වෛකල්පිත විෂයයන් හැර). |

(2) *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුයි.
2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර තුනක් ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුයි. (පදිංචිය වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කොට සනාථ කර තිබිය යුතුයි.)
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුයි. (දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර, අනියම්, තාවකාලික, ආදේශක, ස්වේච්ඡා තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
4. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් විය යුතුයි.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවකු හෝ රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතුයි.

(3) *බඳවා ගැනීමේ ක්‍රමය :*

1. සේවා අවශ්‍යතාවයට අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණ සහ ප්‍රායෝගික පරීක්ෂණ මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.
2. දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක/දීමනා/ස්වේච්ඡා පදනම මත සේවයේ නියුතු අයදුම්කරුවන්ට වඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
3. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.
4. සුදුස්සන් තෝරා ගැනීම පිළිබඳව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

(4) *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

1. සියලුම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුයි.
3. බඳවාගනු ලබන තැනැත්තන් වසර 03ක පරිවාස කාලයකට යටත්වන අතර, ශ්‍රේණිගත උසස්වීමක් නම් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වේ.
4. රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත්, විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු සඳහාත්, දැනටමත් සම්පාදනය කොට ඇති හා මින් මතු සම්පාදනය කළ හැකි විධිවිධානයන්ට එකඟව ක්‍රියා කළ යුතුයි.
5. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව වයඹ ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, වයඹ පළාතේ පළාත් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටී.

(5) අයදුම්පත් ඉදිරිපත් කිරීම :

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2015.07.03 වැනි දින හෝ ඊට ප්‍රථම " ලේකම්, ගල්ගමුව ප්‍රාදේශීය සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

2. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ, තනතුර සඳහන් කර අයදුම්පත එවිය යුතුයි.

3. අයදුම්පත සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි :

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික;
(iii) තම පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය;
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් එකක් විය යුතු ය.);
(v) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික. (රජයේ /පළාත් පාලන සේවයෙන් නියුක්ත වූවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය..

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ගල්ගමුව.

2015 මැයි මස 26 වැනි දින,

**ආදර්ශ අයදුම්පත්‍රය**

***වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ................................ තනතුර සඳහා අයදුම්පත්‍රය***

1. (i) අයදුම්කරුගේ මුලකුරු සමග නම :—————————.
   (ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————————.
2. ස්ථිර ලිපිනය :—————————,
3. (i) උපන් දිනය : අවුරුද්ද :—————, මාසය :—————, දිනය :—————,
   (ii) 2015.07.03 දිනට වයස : අවුරුදු :—————, මාස :—————, දින :—————,
4. ජාතික හැඳුනුම්පත් අංකය :—————————,
5. ස්ත්‍රී/පුරුෂ භාවය :—————————,
6. විවාහක/අවිවාහක බව :—————————,
7. ජාතිය :—————————,
8. වයඹ පළාත තුළ ස්ථිර පදිංචි කාලය :—————————,
9. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :—————————,
10. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :—————————,
   (i) සමත් වූ වසර/ශ්‍රේණිය :—————————, වර්ෂය:—————————,
   (ii) අ.පො.ස. (සා.පෙළ) විභාගය :—————————,
   විභාග අංකය :—————————. වර්ෂය:—————————,

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ii) අ.පො.ස. (උ.පෙළ) විභාගය :—————————,
   විභාග අංකය :—————————, වර්ෂය:—————————,

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

11. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :————————,
12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් සේවා කාලය සහ විස්තර :————————,
13. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේ ද?

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

දිනය : ............................

————————,
අයදුම්කරුගේ අත්සන.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**
(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි)

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදාහැරීමට එකඟවන බවත්, දැනට ..............................................................වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

————————,
දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතුයි.)

දිනය :————————,

06-408

---

**යටිනුවර ප්‍රාදේශීය සභාව**

අංක 1908 දරන 2015 මාර්තු මස 27 වැනි සිකුරාදා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) වැනි පළාත් පාලන කොටසේ පළ වූ *ගැසට් නිවේදනයේ* සෞඛ්‍ය කම්කරු තනතුරුවලට බඳවා ගැනීමේ කොටස මෙයින් අවලංගු කරන අතර, පහත සඳහන් ගැසට් නිවේදනය බලාත්මක කරන බව මෙයින් දන්වමි.

යටිනුවර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් නියමිත සුදුසුකම් ඇති යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| සෞඛ්‍ය කම්කරු | 02 | PL 1-2006A රු.11,730-10x120-10x130-10x145-12x160- රු.17,600 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයකදී දෙවරකට නොවැටි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයන් 05ක් එකවර සමත් වී තිබිය යුතුය. |

02. *කායික සුදුසුකම්* :

සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

03. *වෙනත් සුදුසුකම්* :

(i). යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වසර 03කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතු ය.

(ii) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
(iii) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
(iv) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.
(v) අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු.
(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවකු හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතුය.

04. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි :*

(I) මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය.
(II) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
(III) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතු ය.

05. සුදුසුකම් සපුරාලන අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවීමෙන් පසුව සම්මුඛ පරීක්ෂණයක් සඳහා භාජනය කරනු ඇත.

06. අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් ලියකියවිලිවල පිටපත් තමා විසින් සහතික කර එවිය යුතු ය.

(I) උප්පැන්න සහතිකය;
(II) අධ්‍යාපන සහතික;
(III) පදිංචිය සනාථ කිරීමේ සහතිකය;
(IV) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්;
(V) මෑතක දී ලබාගත් ග්‍රාමසේවා සහතිකය;
(VI) වෘත්තීය සුදුසුකම් දැක්වෙන සහතික ;
(VII) පළපුරුද්ද දැක්වෙන සහතික.

තනතුර ඉල්ලීම අපේක්ෂා කරන අයදුම්කරුවන් මෙහි දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පතක් 2015 ජූනි මස 29 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "ලේකම්, යටිනුවර ප්‍රාදේශීය සභාව, ඇඹිල්මීගම, පිළිමතලාව" යන ලිපිනයට එවිය යුතු ය. අදාළ අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහල කෙළවරේ තනතුර සඳහන් කළ යුතුය.

ඩබ්. පී. සෙනෙවිරත්න බණ්ඩාර,
ලේකම්,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

2015 මැයි මස 27 වැනි දින,
යටිනුවර ප්‍රාදේශීය සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත

***යටිනුවර ප්‍රාදේශීය සභාව***

***.............................................................................................. තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. මුලකුරු සමග නම :——————,
02. මුලකුරු වලින් හැඳින්වෙන නම්:——————,
03. ස්ථිර ලිපිනය:——————,
04. ස්ත්‍රී/පුරුෂ භාවය :——————,
05. උපන් දිනය :
අවුරුද්ද :——————, මාසය :——————, දිනය :——————,
06. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? :——————, ලියාපදිංචියෙන් ද? :——————,
07. අධ්‍යාපන සුදුසුකම් :——————,
(I). අ.පො.ස. (සා.පෙළ) විභාගය :——————,
සමත් වර්ෂය හා විභාග අංකය :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(II). වෙනත් සුදුසුකම් : ——————,

8. වෘත්තීය සුදුසුකම් :————————,
9. සේවා පළපුරුද්ද :————————,

(i) දැනට සේවය කරන ආයතනය :————————,
(ii) දැනට දරන තනතුර :————————,
(iii) එම තනතුරට පත් වූ දිනය :————————,
(iv) පෙර සේවය කරන ස්ථානයේ දරන ලද තනතුර :————————,

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා, නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවාගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා සාවද්‍ය තොරතුරු දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:————————,

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ................................................... මයා මෙම ආයතනයේ ............................................................. වශයෙන් සේවය කරයි. ඔහු සේවයෙන් නිදහත් කළ හැක/නොහැක. ඔහු මොනම ආකාරයේ හෝ නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————,
ආයතන ප්‍රධානියා.

ආයතනය :————————,
නම:————————,
පදවිය:————————,
දිනය:————————,

06-411

---

**මහර ප්‍රාදේශීය සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ, මහර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා බස්නාහිර පළාත තුළ පදිංචි සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය (මාසිකව)* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | රියදුරු | 01 | රු. 12,470 - 10 x 130 - 10 x 145 10 x 160 - 12 x 170 - රු. 18,860 (PL3-2006A) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත්වීම. (එක් වරක දී අවම වශයෙන් විෂයයන් 05 ක් සමත්ව තිබිය යුතුය.) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුනතා සහතිකය හා වාහන රියදුරෙකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතු ය. (සහතික මගින් සනාථ කළ යුතු ය.) අවම උස අඩි 05 ක් විය යුතු ය. දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය. |

*බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :-*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ii) අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්නයේ වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.

(iii) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩය බලනොපානු ඇත)

(iv) අයදුම්කරු මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවෙකු හෝ රජයේ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු ය.

(vi) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස්කම් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම මහර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

*සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

(ii) පත්වීමේ දින සිට අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්වේ.

(iii) වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ නියෝගවලට ද, බස්නාහිර පළාත් සභාව හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මහර ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.
2. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුයි.

(1) උප්පැන්න සහතිකය,
(2) අධ්‍යාපන සහතික,
(3) පදිංචිය සනාථ කිරීමේ සහතිකය,
(4) මෑතකදී ලබාගත් ග්‍රාමසේවා සහතිකය,
(5) මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්,
(6) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික,
(7) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

*අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" ප්‍රමාණයේ අයදුම්පත් සකස්කර ඉල්ලුම් කරන තනතුර අදාළ කවරයේ වම්පස ලියා 2015.07.06 වැනි දිනට පෙර, ලේකම්, මහර ප්‍රාදේශීය සභාව, පහළකරගහමුණ, කඩවත යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතු ය.) නියමිත දිනෙන් පසු ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එස්. ඒ. කේ. එන් ඉන්ද්‍රජිත්,
ලේකම්,
මහර ප්‍රාදේශීය සභාව.

2015 ක් වූ මැයි මස 14 වැනි දින,
මහර ප්‍රාදේශීය සභාව,
පහළකරගහමුණ,
කඩවත.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***මහර ප්‍රාදේශීය සභාව***

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ.. ........................තනතුර සඳහා බඳවා ගැනීම*

1. මුලකුරු සමග නම : ————————,
   මුලකුරු වලින් හැඳින්වෙන නම් : ————————,

2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ——————————,
3. ස්ථිර ලිපිනය : ——————————,
4. ස්ත්‍රී/පුරුෂ භාවය : ——————————,
5. උපන්දිනය : ——————————,
2015.07.06 දිනට වයස : අවුරුදු : ——————————, මාස: ——————————, දින: ——————————,
6. ජාතික හැඳුනුම්පත් අංකය : ——————————,
7. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද/ලියාපදිංචි වීමෙන්ද? : ——————————,
8. (i) අධ්‍යාපන සුදුසුකම්

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

(ii) වෙනත් සුදුසුකම් : ——————————,

9. වෘත්තීයමය සුදුසුකම් : ——————————,
10. සේවා පළපුරුද්ද :
(i) දැනට දරන තනතුර : ——————————,
(ii) එම තනතුරට පත් වූ දිනය : ——————————,
(iii) එම තනතුරේ සේවා කාලය : ——————————,
(iv) මීට පෙර සේවය කරන ලද ස්ථාන හා දරන ලද තනතුරු : ——————————,

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බව මා තෝරා ගැනීමට පෙර හෝ පසුව හෙළිවුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

——————————,
අයදුම්කරුගේ අත්සන

දිනය : ——————————,

*දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම ඉල්ලුම් කරු වන ................................ මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම කාර්යාලයේ ................................... වශයෙන් සේවය කරයි. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
නිල මුද්‍රාව

දිනය : ——————————,

06-321

---

**කොළොන්නාව නගර සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

කොළොන්නාව නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු පිරවීම සඳහා අදාල සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (කොළොන්නාව නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනටමත් කොළොන්නාව නගර සභාවේ, ස්ථිර සේවයේ නියුතු අය කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.)

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් | | වෙනත් හා වෘත්තීය සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| | | | අභ්‍යන්තර (සීමිත) | බාහිර (විවෘත) | | | |
| 1 | සෞඛ්‍ය කම්කරු III | 1 | - | 8 වන ශ්‍රේණිය (9 වසර සමත් වී තිබිය යුතුය) | අදාළ නොවේ. | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 වසර 3 ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්. |
| 2 | පෙදරේරු III | 2 | (අ) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී, කුමන හෝ විෂයයන් 06 ක් සමත් වී තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි. ;සහ<br>(ආ) මෙම තනතුරට අදාලව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.) | (අ) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී, කුමන හෝ විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි ; සහ<br>(ආ) මෙම තනතුරට අදාලව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.) | (අ) වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 වන මට්ටමේ සහතිකය ලබා තිබීම ; හෝ<br>(ආ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ; හෝ<br>(ඇ) ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම ; හෝ<br>(ඈ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ; හෝ<br>(ඉ) ජාතික ආධුනිකත්ව හා කාර්මික | රු. 12,470 - 10 x 130- 10 x 145 - 10 x160 - 12 x 170 - රු. 18,860 4 වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගින්. න්‍යායාත්මක දැනුම පරීක්ෂාව ලකුණු 100. .සමත් ලකුණු ප්‍රමාණය 40%. ප්‍රායෝගික පරීක්ෂණය ලකුණු 100. සමත් ලකුණු ප්‍රමාණය 40% |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු ගණන* | *අධ්‍යාපන සුදුසුකම් අභ්‍යන්තර (සීමිත)* | *බාහිර (විවෘත)* | *වෙනත් හා වෘත්තීය සුදුසුකම්* | *වැටුප් පරිමාණය* | *බඳවා ගැනීම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | | පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA ) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ; *හෝ*<br>(ඊ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම. | | |
| 3 | ආදායම් පරීක්ෂක III | 1 | අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාවට සහ ගණිතය ඇතුළුව යටත් පිරිසෙයින් සම්මාන 2 ක් සහිතව විෂයයන් 06 කින් සාමාර්ථ ලබා තිබීම (මින් විෂයයන් පහ (05) ක් එක්වර සමත් වී තිබිය යුතුයි. | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය සමත්ව තිබීම සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ. පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. | අභ්‍යන්තර අයදුම්කරුවන් කොලොන්නාව නගර සභාවේ ප්‍රාථමික සේවා ගණයක වැටුප් ලබන සේවය ස්ථිර කර ඇති හා වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර මෙම කාලය තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබිය යුතුයි. | රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු. 22,040. වසර 03 ක් ගතවීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය. | ලිඛිත විභාගයක් මගින්.<br><br>*විවෘත විභාගය* :<br>අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය ලකුණු 100. සමත් ලකුණු ප්‍රමාණය 40%<br>සාමාන්‍ය දැනීම ලකුණු 100. සමත් ලකුණු ප්‍රමාණය 40%.<br>*සීමිත විභාගය* :<br><br>සාමාන්‍ය දැනුම හා |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් අභ්‍යන්තර (සීමිත) | බාහිර (විවෘත) | වෙනත් හා වෘත්තීය සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | බුද්ධි පරීක්ෂණය ලකුණු 100. සමත් ලකුණු ප්‍රමාණය 40%. ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම ලකුණු 100. සමත් ලකුණු ප්‍රමාණය 40%. |
| 4 | සෞඛ්‍ය පරිපාලක III | 2 | අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාවට සහ ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 කින් සාමාර්ථ ලබා තිබීම (මින් විෂයයන්) පහක් (05) එකවර සමත් වී තිබිය යුතුයි. | (අ)සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය සමත්ව තිබීම ; සහ<br>(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ. පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. | අභ්‍යන්තර අයදුම්කරුවන් කොලොන්නාව නගර සභාවේ PL 1 හා PL 2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන සේවය ස්ථිර කර ඇති හා ස්ථිර සේවා කාලය වසර පහක් (05) සපුරා ඇති සේවකයින් විය යුතු අතර, සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතු ය. | රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු. 22,040 වසර 03ක් ගතවීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය. | ලිඛිත විභාගයක් මගින්.<br>**විවෘත විභාගය :**<br>අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය ලකුණු 100. සමත් ලකුණු ප්‍රමාණය 40% කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය ලකුණු 100. සමත් ලකුණු ප්‍රමාණය 40%<br>**සීමිත විභාගය :**<br>සාමාන්‍ය දැනීම හා .බුද්ධි පරීක්ෂණය ලකුණු 100. සමත් ලකුණු ප්‍රමාණය 40%. ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම ලකුණු 100. සමත් ලකුණු |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් අභ්‍යන්තර (සීමිත) | බාහිර (විවෘත) | වෙනත් හා වෘත්තීය සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| 5 | වැඩ/ක්ෂේත්‍ර පරිපාලක III | 1 | අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාවට සහ ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබීම (මින් විෂයයන් පහ (05) ක් එක්වර සමත් වී තිබිය යුතුයි. | අ. සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය සමත්ව තිබීම ; සහ<br>ආ. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ. පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. | අභ්‍යන්තර අයදුම්කරුවන් කොලොන්නාව නගර සභාවේ PL 1 හා PL 2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන සේවය ස්ථිර කර ඇති හා ස්ථිර සේවා කාලය වසර පහ (05) ක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතුය. | රු. 13,120 - 10 x 145 - 11 x 170- 10 x 240 - 10 x 320 - රු. 22,040 වසර 03 ක් ගතවීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. | ලිඛිත විභාගයක් මගින්<br>**විවෘත විභාගය**<br>අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය ලකුණු 100 සමත් ලකුණු ප්‍රමාණය 40%<br>කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය ලකුණු 100 සමත් ලකුණු ප්‍රමාණය 40%<br>**සීමිත විභාගය**<br>සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ලකුණු 100 සමත් ලකුණු ප්‍රමාණය 40%<br>ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම ලකුණු 100 සමත් ලකුණු ප්‍රමාණය 40% |

2. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය ;
(ii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය ;
(iii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය ;
(iv) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු 18 ත් 45 ත් අතර විය යුතුය. ආදායම් පරීක්ෂක, සෞඛ්‍ය පරිපාලක හා වැඩ ක්ෂේත්‍ර පරිපාලක තනතුරු සඳහා අවු 30 ට නොවැඩි විය යුතුය ; (රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)
(v) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය ;
(vi) සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට හා ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහිදී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ ;
(vii) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය ;
(viii) රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහ කරනු නොලැබූ අයෙකු විය යුතුය ;
(ix) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය ;
(x) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේ දී බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවා ගැනීමේ පටිපාටි ව්‍යවස්ථා සංශෝධන වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවා ගැනීම් ප්‍රමාද කිරීම්, වෙනස් කිරීම් සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කොලොන්නාව නගර සභාවේ ලේකම් සතුය.

3. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වේ.
(ii) බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වේ. ස්ථිර සේවකයින් එක් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ ;
(රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුය.)
(iii) මීට අමතරව ආයතන සංග්‍රහයේ විධි විධානවලට ද, මුදල් රෙගුලාසි වලට ද, බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට ද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පනවනු ලබන වෙනත් නියෝග වලට ද දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුකූලව කටයුතු කල යුතුය.

4. අයදුම් කළ යුතු ආකාරය :

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (ඒ 4 ප්‍රමාණයේ) අයදුම්පතක් සකස් කර, අයදුම්පත්‍රය බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2015.06.26 දිනට පෙර "ලේකම්", කොළොන්නාව නගර සභාව, කොළොන්නාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් සමග පහත සඳහන් ලියවිලිවල පිටපත් එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතික ;
(iii) ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ;
(iv) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය සනාථ කිරීමේ සහතිකය ;
(v) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික ;
(vi) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික ;
(vii) මෑතක දී ලබා ගත් චරිත සහතික දෙකක් ;(මින් 01 ක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතුය.)
(viii) පොලිස් වාර්තාව.

5. පුරප්පාඩු සංඛ්‍යාව අනුව සම්මුඛ පරීක්ෂණයට, ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයට කැඳ වූ පමණින් ඔබ පත්වීමක් ලැබීමට සුදුස්සෙකු ලෙස නොසැලකිය යුතුය.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය කොළොන්නාව නගර සභාවේ ලේකම් සතු වන්නේ ය.

ගීතානි ඩී. ලොකුවැල්ල,
ලේකම්,
කොළොන්නාව නගර සභාව.

2015 ක් වූ මැයි මස 28 වැනි දින,
කොළොන්නාව නගර සභාවේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළොන්නාව නගර සභාවේ ............................... තනතුර සඳහා බඳවා ගැනීම***

1. (අ) මුලකුරු සමග නම : ———— ;
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් : ———— ;

2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ———— ;

3. ස්ථිර ලිපිනය : ———— ;

4. (අ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? : ———— ;
(ආ) එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? : ———— ;

5. ජාතික හැඳුනුම්පත් අංකය : ———— ;

6. ස්ත්‍රී/පුරුෂ භාවය : ————— ;

7. විවාහක/අවිවාහක තත්ත්වය : ————— ;

8. දුරකථන අංකය : ————— ;

9. උපන් දිනය :
වර්ෂය : ————— ; මාසය : ————— ; දිනය : ————— ;

10. 2015.06.28 දිනට වයස :

අවු. : ————— ; මාස : ————— ; දින : ————— ;

11. අධ්‍යාපන සුදුසුකම් (සමත්වූ විභාග පිළිබඳ විස්තර) : ————— ;

11.1 අයදුම්කරු අවසන් වරට සමත් වූ පංතිය : ————— ;

11..2 අ.පො.ස. (සා. පෙළ) විභාගය : ————— ;

වර්ෂය : ————— ; මාසය : ————— ;
විභාග අංකය : ————— ;
ප්‍රතිඵල : ————— ;

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 5 | |
| 2 | | 6 | |
| 3 | | 7 | |
| 4 | | 8 | |

11..3 අ.පො.ස. (උ. පෙළ) විභාගය
වර්ෂය : ————— ; මාසය : ————— ;
විභාග අංකය : ————— ;
ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |

12. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද : ————— .

13. වෙනත් සුදුසුකම් : ————— .

14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද?/නැත් ද යන වග : ————— .

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බව ද මම දනිමි.

. ..............................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : ....................................................

දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරු වන........................... මහතා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ.................................... වශයෙන් සේවය කරන අතර ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

.

..............................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව යොදන්න)

නම : ————— ;
තනතුර : ————— ;
දෙපාර්තමේන්තුව/ආයතනය : ————— ;

06-426

---

**මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාව**

මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාවේ දැනටමත් පුරප්පාඩුව ඇති පහත සඳහන් තනතුරු සඳහා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | *තනතුරු නාමය* | *වැටුප් ක්‍රමය* | *අයදුම්කිරීම සඳහා අත්‍යාවශ්‍ය වන වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|
| 1. | ට්‍රැක්ටර් රථ රියදුරු/ ලොරි රියදුරු/ මෝටර් රථ රියදුරු | රු.12,470 - 10 x 130 -10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 (රා.ව.ලේ. 6/2006 (iv) අනුව පීඑල් 3- 2006 ඒ) | තාර බර හොන්ඩර 34 ට වැඩි සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද අවම වසර 03 ක් පැරණි රියදුරු බලපත්‍රයක් ලබා තිබීම. (ඒ. පන්තියේ වාහන බලපත්‍ර/නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තිය) |
| 2. | ජේ. සී. බී. ක්‍රියාකරු | | තාර බර හොන්ඩර 34 ට වැඩි සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද අවම වසර 03 ක් පැරණි රියදුරු බලපත්‍රයක් ලබා තිබීම. (ඒ පන්තියේ වාහන බලපත්‍රය/නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තිය) සහ පිළිගත් ආයතනයක පුහුණුවක් ලබා තිබීම. |
| 3. | ආදාහනාගාර ක්‍රියාකරු | රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,600 - (රා.ප.ව.ලේ 6/2006 (iv) අනුව පීඑල් 2- 2006 ඒ) | විදුලි කාර්මික කටයුතු, ගෑස් උඳුන් භාවිතය, බ්ලෝවර් ක්‍රියාකාරීත්වය පිළිබඳ පිළිගත් ආයතනයක වසරකට නොඅඩු පුහුණුවක් ලබා තිබීම |
| 4. | ආදාහනාගාර සහායක | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (රා. ප. ව. ලේ. 6/2006 (iv) අනුව පීඑල් 1-2006 ඒ | අදාළ ක්ෂේත්‍රයේ පලපුරුද්දක් ලබා තිබීම ප්‍රමාණවත්ය |
| 5. | ජේ. සී. බී. සහායක | | |
| 6. | ලොරි රථ සහායක | | |

02. මෙම තනතුරු සඳහා අයදුම් කරනු ලබන සියලුම අයදුම්කරුවන් අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබිය යුතුය. තවද මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය.

03. බඳවා ගැනීමේ පොදු කොන්දේසි හා සේවා නියුක්ත කිරීමේ කොන්දේසි හා මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පහත සඳහන් අංකයෙන් විමසා දැනගත හැක.

081-2241222

04. ඔබ විසින් අයදුම්කරනු ලබන තනතුරට අදාලව පහත ඇමුණුමේ දැක්වෙන ආකෘතිය පරිදි නිවැරදිව සකස් කර ගන්නා අයදුම්පතක් 2015 ජුනි මස 19 දිනට පෙර "ලේකම්, මහනුවර කඩවත් සතර හා ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාව, අම්පිටිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අසම්පූර්ණව හෝ නියමිත දිනය පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ

නියුතු අයදුම්කරුවන් පමණක් තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. තෝරාගන්නා අයදුම්කරුවන් හට ලිඛිත පරීක්ෂණය, සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය පසුව දැනුම් දෙනු ලැබේ. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ තමා අයදුම්කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කල යුතුය.

අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක, විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කල තනතුරක් දරන නිලධාරියෙකු හෝ වාර්ෂික වැටුප රු. 2,37,060 හෝ ඊට වැඩි රාජ්‍ය ස්ථිර නිලධාරියෙකු විසින් තම මුද්‍රාව තබා සහතික කල යුතුය.

05. පත්වීම් නිවේදනය අවලංගු කිරීම, බඳවා ගැනීමේ කල් දැමීම, බඳවා ගනු ලබන අයගේ සංඛ්‍යාව, පත්වීම ක්‍රියාත්මක වන දිනය, සේවයේ යොදවා ගන්නා ආකාරය හා මේ සම්බන්ධයෙන් වන වෙනත් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ බලය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඩී. කොඩිතුවක්කු,
ලේකම්,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාව.

2015 මැයි මස 28 වන දින,
අම්පිටිය, මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාව ........................ තනතුර සඳහා අයදුම්පත්‍රය

(i) මුලකුරු සමග නම : ——————————,
(ii) සම්පූර්ණ නම : ——————————,
(iii) ස්ත්‍රී පුරුෂ භාවය: ——————————,
(iv) වයස: ——————————,
(v) උපන් දිනය: ——————————,
(vi) ස්ථිර ලිපිනය: ——————————,
(vii) දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයෙකුනම් සේවා ස්ථානයේ ලිපිනය: ——————————,
(viii) දුරකථන අංකය: ——————————,
(ix) අධ්‍යාපන සුදුසුකම්: ——————————,

අ.පො.ස. සාමාන්‍ය පෙළ

විභාග අංකය : ——————————, වර්ෂය : ——————————,

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස. උසස් පෙළ

විභාග අංකය : ——————————, වර්ෂය : ——————————,

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

*xi.* වෘත්තීය සුදුසුකම් : ——————————,
*xii.* සේවා පළපුරුද්ද : ——————————,

*අයදුම්කරුගේ ප්‍රකාශය*

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බවත්, පත්වීම් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

——————————,
අත්සන.

දිනය : ——————————,

---

මෙම අයදුම්පත ඉදිරිපත් කරන.......................... (ලිපිනය) හි පදිංචි ........................................ (නම) යන අය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය අද දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

අත්සන : ——————————,

නම : ——————————,

තනතුර : ——————————,

ලිපිනය : ——————————,

---

රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කල යුතුය.

මෙම ඉල්ලුම්කරු වන .......................................(නම) යන අය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ................................. (තනතුර) වශයෙන් සේවය කරයි. පසුගිය වසර කිහිපය තුළ ඔහු/ඇය මොන ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත්. ඉහත තනතුර සඳහා තෝරගත හොත් ඒ සඳහා මුදා හැරිය හැකි බවත් සහතික කරමි.

දිනය : ——————————,

අත්සන : ——————————,

නම: ——————————,

තනතුර : ——————————,

ලිපිනය : ——————————,

06-427

# පළාත් පාලන නිවේදන

## මහනුවර මහනගර සභාව

### තල්වත්ත වලව්වත්ත මාර්ගය මහා නගර සභාවට පවරා ගැනීම

ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහනුවර මහනගර සභා සීමාවේ මහනුවර සිට දිගන දක්වා වූ මාර්ගයෙන් පටන් ගන්නා, බලයලත් මිනින්දෝරු සිරිසුමන මහතාගේ 2002.05.06 දිනැති අංක 2500 දරන පිඹුරේ සඳහන් පහත උපලේඛනයේ දැක්වෙන මාර්ගය මහනුවර මහනගර සභාවට පවරා ගැනීම, 2014.04.29 දින අංක 8 (59) දරන සභා සම්මුතිය අනුව සභා සම්මත වී ඇත.

මෙම මාර්ගය මහනුවර මහනගර සභාව වෙත පවරා ගැනීම සම්බන්ධව ගැසට් නිවේදනය පලවී මාසයක කාලයක් තුළ විරෝධතා ඇත්නම් නාගරික කොමසාරිස්, මහනගර සභාව, මහනුවර යන ලිපිනයට දන්වා එවන ලෙස මෙයින් දන්වා සිටිමි.

එම කාල සීමාව තුළ විරෝධතාවක් ඉදිරිපත් නොවුවහොත් මහනගර සභා ආඥා පනතේ 48(1), (2), (3), (4) උප වගන්ති යටතේ මහනුවර මහ නගර සභාව වෙත මෙම මාර්ගය පැවරෙන බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

*උපලේඛනය*

මහනුවර සිට දිගන දක්වා වූ මාර්ගයෙන් උතුරු නැගෙනහිර දිශාවට පටන් ගන්නා වූ මාර්ගය බලයලත් මිනින්දෝරු සිරිසුමන මහතාගේ 2002.05.06 දිනැති අංක 2500 දරන පිඹුරේ සඳහන් පරිදි මායිම් උතුරින් ප්‍රධාන පාරද, දකුණින් එම පිඹුරේ ලොට් අංක 4 ද, නැගෙනහිරින් එම පිඹුරේ ලොට් අංක 4 බස්නාහිරින් ලොට් අංක 5 ද, නැවත උතුරින් ලොට් අංක 5 හා 4 ද, දකුණින් ලොට් අංක 6 ද, නැගෙනහිරින් වරිපනම් අංක 38, 38/1, 38/2 දේපල ද බස්නාහිරින් ලොට් අංක 6 ද, නැවත උතුරින් ලොට් අංක 6 ද, දකුණින් ලොට් අංක A3 හා ලොට් අංක 7 ද, නැගෙනහිරින් ලොට් අංක 6 ද, බස්නාහිරින් ලොට් අංක 7 ද, නැවත උතුරින් ලොට් අංක 8 හා 7 ද, දකුණින් ලොට් අංක 9 හා 10 ද නැගෙනහිරින් A3 ද, බස්නාහිරින් ලොට් අංක 8 ද, නැවත උතුරින් ලොට් අංක 8 ද, දකුණින් ලොට් අංක 12 හා 11 ද නැගෙනහිරින් ලොට් අංක 9 ද, බස්නාහිරින් ලොට් අංක 9 ද ලෙස දැක්වෙන පිළිවෙලින් අක්කර 0, රූඩ් 02, පර්චස් 19.2 වන මාර්ගය.

චන්දන තෙන්නකෝන්,
මහනුවර නාගරික කොමසාරිස්.

06-241

## ගාල්ල මහා නගර සභාව

### 2015 වසර පරිපූරක අයවැය ලේඛනය

2015 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද පරිපූරක ආදායම් හා වියදම් ඇතුළත් වැඩසටහන් අයවැය ලේඛනය 2015.06.08 දින සිට දින 07 ක කාලයක් ගාල්ල මහා නගර සභා කාර්යාලයේදී මහජනතාවගේ පරීක්ෂාව සඳහා විවෘතව තබන බව මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය) 214 (2) 'ආ' වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. කැලුම් සෙනෙවිරත්න,
ගාල්ල නගරාධිපති (වැඩබලන),

2015 ජූනි 05 වන දින,
ගාල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

06-240

## ගම්පහ මහා නගර සභාව

### 2015 වර්ෂයේ පරිපූරක අයවැය ඇස්තමේන්තුව

ගම්පහ මහා නගර සභාවේ 2015.06.05 දින පැවැත්වීමට නියමිත මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීම සඳහා 2015 වර්ෂයේ පරිපූරක අයවැය ඇස්තමේන්තුව 2015.05.28 දින සිට දින 07 ක් මහජන පරීක්ෂාව සඳහා මෙම කාර්යාලයේ තබා ඇති බව 252 අධිකාරිය වන මහා නගර සභා ආඥා පනතේ 214(අ) යටතේ දැනුම් දෙමි.

එරංග සේනානායක,
නගරාධිපති,
මහ නගර සභාව - ගම්පහ.

2015 මැයි මස 28 වැනි දින.

06-360

## හබරාදූව ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) (ආ) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර, දකුණු පළාත් සභාවේ ගාල්ල දිස්ත්‍රික්කයේ හබරාදූව ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් හබරාදූව ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත් වලට අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරුද්ධතාවයක් පලකරනු ලබන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පලවූ දිනයේ සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුල යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මාර්ග හබරාදූව ප්‍රාදේශීය සභාව සතු මාර්ග වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඉන්ද්‍රානි ගුණසේකර,
ලේකම්,
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2015 මැයි මස 25 වැනි දින,
හබරාදූව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *මාර්ගයේ නම* | *මාර්ගයේ ආරම්භය* | *මාර්ගයේ අවසානය* | *ග්‍රාමනිලධාරී වසම* | *මාර්ගයේ දිග කි. මී.* | *මාර්ගයේ පළල මීටර්* |
|---|---|---|---|---|---|
| වලකඩවත්ත පාර | හැඩිවත්ත පිලාන මාර්ගය | නිවස | ඌරගස්ගොඩ | 0.12 | 4.87 |

06-292

---

## පූජාපිටිය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) අ උප වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) අ උප වගන්තිය ප්‍රකාර මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය සභාව විසින් පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මාවත පූජාපිටිය ප්‍රාදේශීය සභාව සතු මාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් මෙම මාර්ගයට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් යම් විරුද්ධත්වයක් පලකරන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරනු ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් පූජාපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා ප්‍රකාශයට පත් කරමි.

අනුර කුමාර මඩලුස්ස,
සභාපති,
පූජාපිටිය ප්‍රාදේශීය සභාව.

2015 මැයි මස 28 වැනි දින,
පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

| | | |
|---|---|---|
| පාරේ නම | : | බටුගොඩ බටගල්ල යා කරන දෙල්ගොල්ල මාර්ගය |
| ග්‍රාම නිලධාරී වසම | : | බටුගොඩ දකුණ |
| මාර්ගයේ ආරම්භය | : | බටුගොඩ දකුණ සමඟි මාවත |
| මාර්ගයේ අවසානය | : | බටගල්ල ගම් සභා පාර සමඟි මාවත |
| පළල | : | අඩි 8-0 |
| දුර ප්‍රමාණය | : | අඩි 1770'0" |

**උපලේඛනය**

වම

01. අබේරත්න මයාට අයිති ඉඩම
02. බී. ආර්. සීලවතී මියට අයත් සේරුගහපිටිය වත්ත ඉඩම
03. බී. ජී. සූරසේන මයාට අයත් සේරුගහපිටියහේන ඉඩම
04. ආර්. ජී. එස්. ප්‍රසාද් රත්කොත් මයාට අයත් සේරුගහපිටියහේන ඉඩම
05. ඊ. එම්. ප්‍රේමා හේරත් මියට අයත් දෙල්ගොල්ලහේන ඉඩම
06. යූ. ආර්. ජී. යසවතී මියට අයත් දෙල්ගොල්ලහේන ඉඩම
07. ඩබ්. එල්. ධර්මසේන මයාට අයත් සේරුගහපිටියහේන ඉඩම
08. එම්. එන්. සරෝජා ප්‍රේමවංශ යන අයට අයත් දෙල්ගොල්ලහේන ඉඩම
09. ආර්. ඒ. කේ. ජයරත්න මයාට අයත් දෙල්ගොල්ලහේන ඉඩම
10. බී. ආර්. ජයසිංහ මයාට අයත් දෙල්ගොල්ලහේන ඉඩම
11. සරත් වීරසේකර මයාට අයත් දෙල්ගොල්ලහේන ඉඩම

දකුණ

01. සුනිල් පියසේන මහතාට අයත් ඉඩම
02. කොලගොල්ලපිටියේ රජමහා විහාරයට අයත් සේරුගහපිටියහේන ඉඩම
03. කේ. ජී. සෝමරත්න මයාට අයත් ඉහල කුරුකුදේගෙදර ඉඩම
04. එච්. සී. ගුණරත්න මයාට අයත් සේරුගහපිටියහේන ඉඩම
05. කේ. එම්. ලීලාරත්න මයාට අයත් සේරුගහපිටියහේන ඉඩම
06. ඩබ්. එල්. උපාලි ඒකනායක මයාට අයත් සේරුගහපිටියහේන ඉඩම
07. වයි. ජී. නිශාන්ත මයාට අයත් සේරුගහපිටියහේන ඉඩම
08. ඩබ්. එල්. ධර්මසේන මයාට අයත් සේරුගහපිටියහේන ඉඩම
09. එම්. එන්. සරෝජා ප්‍රේමවංශ යන අයට අයත් දෙල්ගොල්ලහේන ඉඩම
10. ආර්. ඒ. කේ. ජයරත්න මහතාට අයත් ඉඩම

| වම | දකුණ |
|---|---|
| 12. බී. එන්. කුලතුංග මයාට අයත් දෙල්ගොල්ලහේන ඉඩම<br>13. බී. ආර්. චම්පිකා වික්‍රමරත්න මයාට අයත් දෙල්ගොල්ලහේන ඉඩම<br>14. උපසේන දයානන්ද මයාට අයත් දෙල්ගොල්ලහේන ඉඩම<br>15. බී. ජී. එම්. කිර්තිසිංහ මයාට අයත් දෙල්ගොල්ලහේන ඉඩම<br>16. සිරිපාල වික්‍රමරත්න මයාට අයත් දෙල්ගොල්ලහේන ඉඩම<br>17. ආර්. ජී. ප්‍රේමරත්න මයාට අයත් දෙල්ගොල්ලහේන ඉඩම | |

06-362

---

## යටිනුවර ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) (ආ) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් යටිනුවර ප්‍රාදේශීය සභා සතු මංමාවත් වලින් කොටසක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ ජනතාව විසින් හෝ මංමාවත් වලට අදාල ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරුද්ධතාවයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට එක් මසක් ඇතුලත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

මෙම කාල සීමාව තුල මෙම නිවේදනය පිළිබඳව යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

එම්. එම්. තුසිත කුමාර වලගෙදර,
සභාපති,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

2015 මැයි මස 27 වැනි දින,
යටිනුවර ප්‍රාදේශීය සභාව,
ඇඹිල්මීගම, පිළිමතලාව.

| *අනු අංකය* | *පාරේ නම* | *ග්‍රාම නිළධාරී වසම* | *පටන් ගන්නා ස්ථානය* | *අවසන් වන ස්ථානය* | *වම් පැත්ත* | *දකුණු පැත්ත* | *දිග මීටර්* | *පළල මීටර්* | *පිඹුරුපත් අංකය* |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | සමාධි මාවත | කිරිබත්කුඹුර බටහිර | කොළඹ නුවර පාර | කෙහෙල්වත්ත | වයි. එම්. තිස්සකුමාර<br>ඊ. එම්. එස්. ආර් දිසානායක<br>යූ. හපුආරච්චි<br>ඩී. එම්. පී. දිසානායක<br>යූ. ජී. ජයසුන්දර | කේ. එම්. විජේරත්න<br>ආර්. එම්. එම් රත්නායක<br>ඒ. එම්. එම්. අබේසේකර<br>පී. එච්. එම්. හේරත්<br>එන්. ඩබ්. මාරසිංහ<br>ඊ. එම්. ආර්. කේ. ලියනගේ<br>ආර්. එම්. ටිකිරි බණ්ඩා<br>එච්. ජී. අනුලාවතී | 250 | අඩි 10 | 700 |
| 02 | සමගි මාවත | උඩර්රියගම නැගෙනහිර මාර්ගය | පේරාදෙණිය කෙන්හින්ද | 1851/15 | ටී. එච්. එස්. සී. තෙන්නකෝන්<br>නීල් ද සිල්වා<br>ටී. ජී. වීරසිංහ<br>එච්. එම්. අනුලා කුමාරිහාමි | ජී. එස්. කේ. ප්‍රතාපසිංහ<br>ඩබ්. පී. එම්. ඒ. වීරපරාක්‍රම<br>ඩබ්. ජී. ආනන්ද<br>කේ. සිවමනී<br>එස්. වයලට් | අඩි 825 | අඩි 15 | 185'1<br>1851/16 |

| අනු අංකය | පාරේ නම | ග්‍රාම නිලධාරී වසම | පටන් ගන්නා ස්ථානය | අවසන් වන ස්ථානය | වම් පැත්ත | දකුණු පැත්ත | දිග මීටර් | පළල මීටර් | පිඹුරුපත් අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | එස්. එම්. පුෂ්පකුමාර<br>එම්. ඒ. ශ්‍රියාණි<br>පී. බී. ජේ. ජයතිලක<br>එස්. එම්. සී. පී. කුමාර<br>ඩී. ආර්. එස්. දසනායක<br>වෙනුවට<br>නෙරංජලා<br>සමන් කුමාරි<br>එම්. එස්. කුමාරසිංහ<br>වෙනුවට | එෆ්. එස්. අහමඩීන්<br>එච්. ආර්. ඒ. එම්. අහමඩ් | | | |
| 03 | පහළ බෝඅංග වලව්වත්ත පාර | අරඹේගම අරඹේගම නැගෙනහිර | පහල බෝඅංග දන්තුරේ ඉඩමේ පාර අනෝන්‍යාධාර සමිති ශාලාව අසළ | | ඩබ්. එම්. එන්. පී. කේ. විජේසුන්දර<br>ඩබ්. එම්. එන්. බී. විජේසුන්දර,<br>ඩබ්. ඊ. හේමා දයාවතී<br>ඩබ්. ඊ. චන්ද්‍රාවතී<br>පී. වී. පී. ජී. නානායක්කාර<br>ආර්. එම්. එම්. ඒ.<br>පී. ආර්. ඒ. බී. වැවේ ගම, එස්. එම්. ඒ. එස්. සේනානායක. | නන්දා ගුණසේකර<br>පී. කේ. ගුණසේකර | 160 | අඩි 10 | 2028 |
| 04 | වට්ටං වත්ත මාර්ගය | කිරිබත්කුඹුර බටහිර | නානුඔය නාන මංකඩට බසින මංසන්ධිය | එස්. කේ. සංගක්කාර මයාගේ ඉඩම | එස්. කේ සංගක්කාර<br>ටී. කේ. සංගක්කාර<br>ආර්. එම්. ආර්. කේ. දිසානායක | කේ. එම්. කපිල රත්න බණ්ඩා<br>කේ. එම්. එන්. චන්දන බණ්ඩාර<br>කේ. එම්. එන්. එන්. කුලතුංග | 62 | 04 | 1614 |

06 - 412